# ඉස්ලාමීය නීති ව්‍යුහය



The Cooperative Office For Call And Guidance at Sultanah
Under the Supervision of
Ministry of Islamic Affairs Endowment and Call and Guidance
Tel. 4240077 Fax 4251005 P.O.Box 92675 Riyadh 11663 - Al-Swaidi Str. K.S.A
E-mail : Sultanah@hotmail.com

**أحكام فقهية**

ترجمه للغة السنهالية:

# شعبة توعية الجاليات في الزلفي

الطبعة الأولى : ٦/١٤٢٤ هـ.


ⓒ شعبة توعية الجاليات بالزلفي ، ١٤٢٤هـ



فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي

أحكام فقهية - سنهالي / شعبة توعية الجاليات بالزلفي . - الزلفي ، ١٤٢٤ هـ

٤٤ ص ؛ ١٢ × ١٧ سم

ردمك : ٦ - ٢٨ - ٨٦٤ - ٩٩٦٠

١- العبادات (فقه إسلامي)

٢- الزواج (فقه إسلامي) أ- العنوان

ديوي ٢٥٢ ١٤٢٤/٥١٤١

رقم الايداع: ١٤٢٤/٥١٤١

ردمك: ٦-٢٨-٨٦٤-٩٩٦٠

الصف والإخراج: شعبة توعية الجاليات في الزلفي

# أحكام الزكاة
# සකාත් හි නීතිරීති

සකාතය (අනිවාර්ය දානය) ඉස්ලාම් ධර්මයේ තෙවෙනි අනිවාර්ය කරුණෙකි. මුස්ලිම් වරයෙක් තමා සතු සම්පත් නිසාබය (සකාතය අනිවාර්යවන අවම ප්‍රමාණය)ට ලක්වී, එය හව්ලක් (වසරක කාලයක්)ද සම්පූර්ණවූයේනම්, ඔහුට සකාතය දීම අනිවාර්ය වේ. අල්ලාහ් මේ පිළිබඳව මෙලෙස පවසන්නේය.

*තවද, (ඔබලා) සලාතය (නැමදුම) ඉටු කරන්න. තවද, සකාතය (අනිවාර්ය දානය)ද ගෙවන්න.*

*(අල්කුර්ආන්-2:110)*

සකාතය දීමේදී අනුගමනය කළයුතු නීතිරීතීන් හා එහි ප්‍රයෝජනයන් ගැන ඉස්ලාම් ධර්මය පැහැදිලි කරයි. ඒවා මෙසේය.

1-ආත්මාව පවිත්‍රකර ලෝභකම තුරන් කරයි.
2-මුස්ලිම්වරයාට දානය කිරීමේ මනෝභාවය ලබා දෙයි.
3-දුප්පතා හා පොහොසතා අතර ස්ථිර සම්බන්ධයක් ඇති කරයි. මක්නිසාදයත්, ආත්මාව උපකාර කරන්නා කරා ආකර්ෂණය වන්නේය.
4-අසරණ (දිළිඳු) මුස්ලිම් වරයාගේ අවශ්‍යතාවය ඉටු කරයි.
5-පාප ක්‍රියාවෙන් මිනිසා මුදවා ගැනීම (පවිත්‍ර කිරීම) සකාතයේ ප්‍රයෝජනයකි. මෙය පාප ක්‍රියාවන් මකා (විනාශ කර) තරාතිරම උසස් කිරීමට හේතුවන්නේය.

# සකාතය අනිවාර්යවන ද්‍රව්‍ය

1-රත්රන්
2-රිදී
3-වෙළඳ භාණ්ඩ
4-සිව්පාවුන්
5-පොළොවෙන් ලැබෙන ඇට, පළතුරු හා ලෝහ වර්ග.

## රත්රන් හා රිදී සඳහා සකාතය

රත්රන් හා රිදී කුමන තත්ත්වයේ (ස්වභාවයේ) ඇතත් ඒ සඳහා සකාතය ගෙවීම අනිවාර්ය වේ. කවරෙක් සතුව රත්රන් හා රිදී නිසාබය (නියමිත අවම ප්‍රමාණය)ට ලක්ව පවතින්නේද ඔහු සකාතය දිය යුතුයි. රත්රන් හි නිසාබය මිස්කාල් විස්ස (20) කි. එය ග්‍රෑම් 70 ට සමාන වේ. රිදී හි නිසාබය දිර්හම් තබවි 200 කි. එය ග්‍රෑම් 460 ට සමාන වේ. කවරෙක් සතුව රත්රන් නිසාබ් ප්‍රමාණයක් තිබේද ඔහු 2.5 බැගින් සකාතය ගෙවිය යුතුයි. එය ග්‍රෑම් 1.75 කි. එසේම, කවරෙක් සතුව රිදී නිසාබ් ප්‍රමාණයක් තිබේද ඔහු ග්‍රෑම් 11.5 ක් ගෙවිය යුතුයි. මෙය දේශීය මුදලින් දීමට අදහස් කරන්නේනම්, එවිට රත්රන් හා රිදී හි ග්‍රෑමයකට පවතින වටිනාකම හවුල් සමයේ විමසා බැලිය යුතුයි. පසුව එම වටිනාකම අනුව දේශීය මුදලින් සකාතය දිය යුතුයි.

පුද්ගලයෙක් සතුව රත්රන් ග්‍රෑම් 100 ක් තිබේනම්, ඔහු එයින් සකාතය ගෙවීම අනිවාර්යවේ. මක්නිසාද යත්, ඔහු නිසාබයට ලක්වී සිටින්නේය. එහි සකාතය ග්‍රෑම් 2.5 කි. ඔහු තම සකාතය තම දේශීය මුදලින් දීමට අදහස් කළේ

නම්, ඔහු එවකට පවතින වටිනාකම විමසා ග්‍රෑම් 2.5 ට සමාන මුදලක් දිය යුතුයි.

එසේම පරිහරණය කරන මුදල් සඳහාද සකාතය අනිවාර්යවේ. එය එම මුදල නිසාබයට ලක්වී හවලද සම්පූර්ණ විය යුතුයි. යමෙකු සතුව රත්රන් ග්‍රෑම් 70 ක වටිනාකමට සමාන මුදලක් තිබේනම් සකාතය ගෙවීම ඔහුට අනිවාර්ය වේ. එනම් ඔහු 2.5 බැගින් ගෙවිය යුතුයි. මුස්ලිම් වරයෙක් සතුව ඇති මුදලට අදාල කාල සීමාව සම්පූර්ණ වූයේනම්, ඔහු රත්රන් වෙළෙන්දෙකුගෙන් රත්රන් ග්‍රෑම් 70 ක වටිනාකම විමසිය යුතුයි. එම වටිනාකමට අයත් මුදල් ප්‍රමාණය ඔහු සතුව තිබේනම්, ඔහු සකාතය ගෙවිය යුතුයි. ඔහු සතුව ඇති මුදල් ප්‍රමාණය වෙළෙන්දා පැවසූ මුදල් ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් නම්, ඔහු සකාතය නොගෙවිය යුතුයි. එයට උදාහරණයක් මෙසේය.

පුද්ගලයෙක් සතුව ඩොලර් 800 ක මුදලක් තිබී එයට හවල් කාලයද සම්පූර්ණවිය. එනම් ඔහු තම දේශයේ මුදල් පරිහරණය රත්රන් හි වටිනාකමට සමානව පවතින්නේ නම්, රත්රන් ග්‍රෑම් එකක වටිනාකම හෝ, තම දේශයේ මුදල් පරිහරණය රිදී හි වටිනාකමට සමානව පවතින්නේ නම්, රිදී ග්‍රෑම් එකක වටිනාකම විමසා බැලිය යුතුයි. එවිට ග්‍රෑම් 70 ක වටිනාකම ඩොලර් 840 ට සමාන වන බව ඔහු දැනගත්තේනම් සකාතය ගෙවීම ඔහුට අනවශ්‍යවේ. මන්ද, ඔහු සතුව ඇති මුදල් ප්‍රමාණය නිසාබයට ළගාවී නොමැත. එම නිසාබය රත්රන් ග්‍රෑම් 70 ක වටිනාකමකි. එසේම රිදී පරිහරණයේ දීද අනුගමනය කළ යුතුය.

## කොටස් සඳහා සකාතය

වත්මන් කාලයේ මිනිසුන් නිශ්චල හා චංචල දේපලෙහි කොටස්කරුවන් ලෙස බැඳී සිටිති. සමහරවිට වසර ගණනාවක් තමන් සඳහාවූ කොටස ඉතුරුකර රැස්කරන්නන්ද මවුනතර සිටිති. එම කොටස විටක වටිනාකමින් අධිකවේ විටක වටිනාකමින් අඩුවේ. මෙවන් කොටස් සඳහා සකාතය ලබාදිය යුතුයි. මක්නිසාද යත්, මෙය වෙළඳ භාණ්ඩ ලෙස සැළකේ. සෑම වසරක්ම එහි වටිනාකම බලා එයට අදාලවූ සකාතය ලබාදීම මුස්ලිම් වරයාට අනිවාර්ය වේ. නොඑසේ නම්, එය විකුණා එහි වටිනාකම ලබා සෑම වසරක් සඳහාම ගණන් බලා සකාතය ගෙවිය යුතුයි.

## වෙළඳ භාණ්ඩ සඳහා සකාතය

අල්ලාහ් වෙළඳ කටයුතුවල යෙදීම සහ එමගින් ඉපයීම අනුමත කරයි. යම් මූල ධනයක් යොදා වෙළඳ කටයුතුවල යෙදී සිටින මුස්ලිම් වෙළෙන්දා අල්ලාහ් තමාට ලබාදී ඇති දායාදයට තුති පුදකිරීමක් වශයෙන්ද, තම සහෝදරයාගේ අවශ්‍යතාවය සපුරාලීම සඳහාද සකාතය ගෙවීම ඉස්ලාම් ධර්මය අනිවාර්ය කරයි. මෙහි ලාභ සිතුවිල්ල මත කරන සියළුම දේ (ගැනීම් සහ විකිණීම්) අන්තර්ගත වේ. මේවා නිශ්චල දේපළ, සත්තුන්, කෑමබීම, යාන වාහන හා මෙවන් දේය. මෙයට නිසාබය ලක්වීම කොන්දේසියෙකි.

මේ වෙනුවෙන් රත්රන් හෝ රිදී හි වටිනාකම බැලිය යුතුයි. මෙහි මුළු වටිනාකමට 2.5% බැගින් ගණන් බලා සකාතය ලබා දීම අවශ්‍යවේ. උදාහරණයක් මෙසේය.

පුද්ගලයෙක් සතුව ඩොලර් 100,000 වටිනා වෙළඳ කළ භාණ්ඩ තිබෙන්නේනම්, ඔහු එයින් ඩොලර් 2500 ක් ගෙවිය යුතුයි. සියලුම ගැණුම්කාර හා විකුණුම්කාර වෙළෙන්දන් තමා සතුව ඇති දේ පිළිබඳව වාර්ෂිකව ගණන් බලා එයට අයත් සකාතය ගෙවිය යුතුයි. වෙළෙන්දෙක් වසරක් සම් පූර්ණවීමට දින දහයට පෙර භාණ්ඩයක් මිළදී ගත්තේනම්, ඒ සඳහාද අනෙකුත් භාණ්ඩ හා සමග සකාතය ගෙවිය යුතුයි. වෙළඳාම ආරම්භ කළ දින සිට හවල් (වසර) ආරම්භ වේ. සකාතය යනු වාර්ෂිකව ගෙවන එකකි. එනිසා, සෑම මුස්ලිම්වරුන් තම සතුව පවතින දේ සඳහා සෑම වසරක්ම සකාතය ගෙවිය යුතුයි.

ආහාර දී ඇති කරන සිව්පාවන් වෙළඳාම සඳහා යොදා ගත්තේ නම්, එය නිසාබයට (අවම ප්‍රමාණයට) ළක්වුවත් නොවුවත් ඒ සඳහා සකාතය ගෙවිය යුතුයි. එහි වටිනාකම මුදලින් සකාතයේ නිසාබය ඉක්මවා යන්නේනම්, ඒ සඳහා මුදලින් සකාතය ගෙවිය යුතුයි.

## පොළොවෙන් ලැබෙන දේ සඳහා සකාතය

මැනීමට හා රැස්කර ඉතුරු කිරීමට හැකි ඇට හා පළ තුරු වර්ග සඳහා සකාතය ගෙවීම අවශ්‍යවේ. ඒවා රට ඉඳි, මිදි, තිරිඟු (පොතු සහිත), තිරිඟු ඇට (පොතු රහිත) සහ හාල් යනාදීන්ය. නමුදු, (ඉතුරු කිරීමට නොහැකි) පළතුරු හා එළවළු වර්ග සඳහා සකාතය අනිවාර්ය නොවන්නේය. මෙහි නිසාබය ළක්වන විට සකාතය ගෙවිය යුතුයි. එම නිසාබය කිලෝ 675 ක් වන අතර, තිරිඟු ඇට හි නිසාබය කිලෝ 552 කි.

මෙවන් වර්ග සඳහා හවුල් (වසරක කාලයක්) සම්පූර්ණ වීම අනවශ්‍යය වේ. මේවා ගොවියාගේ වියදමින් තොරව වැහි, සහ ගංගා ජලය මගින් වැඩෙන්නේ නම්, ඒ සඳහා දහයෙන් එකක් සකාතය වශයෙන් ගෙවිය යුතුයි. නමුත් ගොවියාගේ වියදම මත ජලය සැපයීම සිදුවන්නේ නම්, ඒ සඳහා විස්සෙන් එකක් සකාතය වශයෙන් ගෙවිය යුතුයි. මෙයට උදාහරණයක් මෙසේය.

පුද්ගලයෙක් තිරිඟු වගාකර අස්වැන්නයේදී කිලෝ 800 ක් ලබයි. එසේනම් සකාතය ගෙවීම ඔහුට අනිවාර්ය වේ. මක්නිසාදයත්, තිරිඟු හි නිසාබය කිලෝ 675 කි. ඔහු වියදම් නොකර ජලය සපයා වගා කළේනම්, දහයෙන් එකක් එනම් කිලෝ 80 ක්ද, වියදම් කර ජලය සපයා වගා කළේ නම් විස්සෙන් එකක් එනම් කිලෝ 40 ක්ද ගෙවිය යුතුයි.

## සිව්පාවන් සඳහා සකාතය

සිව්පාවන් යනුවෙන් අදහස් වන්නේ ඔටුවන්, ගවයන්, එළුවන් හා බැටළුවන් යන සතුන්ය. පහත සඳහන් කොන්දේසි අනුව මෙහි සකාතය ගෙවීම අවශ්‍යවේ.

1-නිසාබය ලක්වීම. ඔටුවන්ගේ අවම නිසාබය 5 ක්ද, එළුවන්ගේ හා බැටළුවන්ගේ අවම නිසාබය 40 ක්ද, ගවයන්ගේ අවම නිසාබය 30 ක්ද වේ. මෙයට අඩු ප්‍රමාණයන් සඳහා සකාතය නොමැත.

2-හිමිකරු සතුව හවුල (වසරක කාල සීමාවක්) සම්පූර්ණවී තිබීම.

3-වසරේ අධික කාලයක් තණ කෑම සඳහා පිටත්ව යන සිව්පාවන් වීම. තමාගේ සතුව ඇති ආහාර දී ඇතිකරන

සිව්පාවන් සඳහා හෝ, තමා විසින් ඔවුන්ට ආහාර මිළට ගෙන හෝ රැස්කර ගෙන හෝ දී ඇතිකරන සිව්පාවන් සඳහා සකාතය ගෙවීම අනිවාර්ය නොවන්නේය. නමුදු, වසරේ අධික කාලයක් තණකෑම සඳහා පිටත්ව යන් නේනම්, ඒවා සඳහා සකාතය ගෙවීම අනිවාර්යවේ.

4-හිමිකාරයා ගොවිතැන් කිරීමට හෝ ප්‍රවාහනය කිරීමට හෝ වෙනත් කාර්යයන් සඳහා හෝ යොදවන සිව්පාවන් නොවීම.

## ඔටුවන් කෙරෙහි සකාතය

ඔටුවන්ගේ නිසාබය අනුව පස් දෙනෙකු සිටින්නේනම්, ඒ සඳහා සකාතය ගෙවීම අනිවාර්ය වේ. මුස්ලිම් වරයෙක් සතුව ඔටුවන් 5 සිට 9 දක්වා සංඛ්‍යාවක් තිබී හවුල් කාලයද සම්පූර්ණවූයේ නම්, ඒ සඳහා එළුවෙකු සකාතය වශයෙන් දිය යුතුයි. එසේම 10 සිට 14 දක්වා එළුවන් දෙදෙනෙකුද, 15 සිට 19 දක්වා එළුවන් තුන් දෙනෙකුද, 20 සිට 24 දක්වා එළුවන් සිව් දෙනෙකුද, 25 සිට 35 දක්වා වසරක් සම්පූර්ණ වූ ගැහැනු ඔටුවෙක්ද එය නොලබන්නේනම්, වසර දෙකක් සම්පූර්ණවූ ඔටුවෙක්ද ගෙවිය යුතුයි.

එසේම 36 සිට 45 දක්වා දෙවසරක් සම්පූර්ණවූ ගැහැනු ඔටුවෙක්ද, 46 සිට 60 දක්වා තුන් වසරක් සම්පූර්ණවූ ගැහැනු ඔටුවෙක්ද, 61 සිට 75 දක්වා සිව් වසරක් සම්පූර් ණවූ ගැහැනු ඔටුවෙක්ද 76 සිට 90 දක්වා දෙවසරක් සම් පූර්ණවූ ගැහැනු ඔටුවන් දෙන්නෙක්ද, 91 සිට 120 දක්වා තුන් වසරක් සම්පූර්ණවූ ගැහැනු ඔටුවන් දෙන්නෙක්ද, සකාතය වශයෙන් ගෙවිය යුතුයි.

මීට වඩා අධිකවන සෑම 40 ක් සඳහාම වසර දෙකක් සම්පූර්ණවූ ගැහැනු මටුවෙක්ද, සෑම 50 ක් සඳහාම වසර තුනක් සම්පූර්ණවූ ගැහැනු මටුවෙක්ද සකාතය වශයෙන් ගෙවීම අනිවාර්යවේ.

## ඔටුවන් කෙරෙහි සකාතය පිළිබඳ ලේඛණය

| සංඛ්‍යාව | | සකාතය |
|---|---|---|
| සිට | දක්වා | |
| 05 | 09 | එළුවෙක් |
| 10 | 14 | එළුවන් දෙන්නෙක් |
| 15 | 19 | එළුවන් තුන් දෙනෙක් |
| 20 | 24 | එළුවන් සතර දෙනෙක් |
| 25 | 35 | බින්තු මඃාල් : වසරක් සම්පූර්ණවූ ගැහැනු මටුවෙක් |
| 36 | 45 | බින්තු ලබූන් : වසර දෙකක් සම්පූර්ණවූ ගැහැනු මටුවෙක් |
| 46 | 60 | හික්කා : වසර තුනක් සම්පූර්ණවූ ගැහැනු මටුවෙක් |
| 61 | 75 | ජිද්ආ : වසර හතරක් සම්පූර්ණවූ ගැහැනු මටුවෙක් |
| 76 | 90 | බින්තා ලබූන් : වසර දෙකක් සම්පූර්ණවූ ගැහැනු මටුවන් දෙන්නෙක් |
| 91 | 120 | හික්කාති : වසර තුනක් සම්පූර්ණවූ ගැහැනු මටුවන් දෙන්නෙක් |

මෙයට වඩා වැඩිවන සෑම 40 ක් සඳහාම බින්තු ලබූන් (වසර දෙකක් සම්පූර්ණවූ ගැහැනු) මටුවෙක්ද, සෑම 50 ක් සඳහාම හික්කා (වසර තුනක් සම්පූර්ණවූ ගැහැනු) මටුවෙක්ද සකාතය ලෙස දිය යුතුයි.

## ගවයන් කෙරෙහි සකාතය

මිනිසෙක් සතුව ගවයන් 30 සිට 39 දක්වා සිටින්නේනම්, ඒ සඳහා වසරක් සම්පූර්ණවූ (ඉප්ලුත් තබීඋත්) ගව (පැටි) යෙක්ද, 40 සිට 59 දක්වා දෙවසරක් සම්පූර්ණවූ (මුසන්නා) එළදෙනෙක්ද, 60 සිට 69 දක්වා වසරක් සමපූර්ණවූ (තබී ආනි) ගව (පැටි)යන් දෙන්නෙක්ද, 70 සිට 79 දක්වා වසර දෙකක් සම්පූර්ණවූ (මුසන්නා) එළදෙනෙක් සහ වසරක් සම්පූර්ණවූ ගව (පැටි)යෙක්ද, මීට වඩා වැඩිවන සෑම 40ක් සඳහාම වසර දෙකක් සම්පූර්ණවූ (මුසින්නා) එළදෙනෙක් බැගින්ද සකාතය ලෙස ගෙවිය යුතුයි.

### ගවයන් කෙරෙහි සකාතය පිළිබඳ ලේඛණය

| සංඛ්‍යාව | | සකාතය |
|---|---|---|
| සිට | දක්වා | |
| 30 | 39 | තබීඋ : වසරක් සම්පූර්ණවූ ගවයෙක් |
| 40 | 59 | මුසන්නා : වසර දෙකක් සම්පූර්ණවූ එළදෙනෙක් |
| 60 | 69 | තබීආනි : වසරක් සම්පූර්ණවූ ගවයන් දෙන්නෙක් |
| 70 | 79 | මුසන්නා සහ තබීඋ : දෙවසරක් සම්පූර්ණවූ එළදෙනෙක් සහ වසරක් සම්පූර්ණවූ ගවයෙක් |

## එළුවන් කෙරෙහි සකාතය

මිනිසෙකු සතුව එළුවන් 40 සිට 120 දක්වා සිටින්නේනම් ඒ වෙනුවෙන් එළුවෙක්ද, මීට වඩා සිට 200 දක්වා එළුවන්

දෙන්නෙක්ද 300 දක්වා එළුවන් තුන් දෙනෙක්ද 400 දක්වා එළුවන් සතර දෙනෙක්ද 500 දක්වා එළුවන් පස් දෙනෙක්ද සකාතය ලෙස ගෙවිය යුතුයි. පසුව සෑම 100 ක් සඳහාම එළුවෙක් බැගින්ද ගෙවිය යුතුයි.

**එළුවන් කෙරෙහි සකාතය පිළිබඳ ලේඛණය**

| සංඛ්‍යාව | | සකාතය |
|---|---|---|
| සිට | දක්වා | |
| 40 | 120 | එළුවෙක් |
| 121 | 200 | එළුවන් දෙන්නෙක් |
| 201 | 300 | එළුවන් තුන් දෙනෙක් |
| 301 | 400 | එළුවන් සතර දෙනෙක් |
| 401 | 500 | එළුවන් පස් දෙනෙක් |

පසුව සෑම 100 ක් සඳහාම එළුවෙක් බැගින් දිය යුතුය.

# සකාතයේ සුදුසුකම්ලාභීන්

මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නිශ්චය වශයෙන්ම, (සකාතය නම්වූ අනිවාර්ය) දානය දිළින්දන්ටද, දුප්පතුන්ටද, සකාතය අයකිරීමේ කටයුතුවල නිරතවන සේවකයන්ටද, ඉස්ලාම ධර්මය කරා තම සිත් ආකර්ෂණයවූවන්ටද, වහලුන්ටද, ණයකාරයන්ටද, අල්ලාහ් ගේ මාර්ගයෙහි යුද්ධකර සිටින්නන්ටද, මගීන්ටද, හිමිවූ දෙයකි. (මෙය) අල්ලාහ් විසින් නියමවූ වගකීමකි. අල්ලාහ් සියල්ලම දැනගත් (ඉමහත්) ඥානවන්තයාය.*

*(අල්කුර්ආන් -9:60)*

අල්ලාහ් සකාතය ලැබීමට සුදුසුකම්ලාභීන් කණ්ඩායම් අටකට වර්ගකර ඇත. ඉස්ලාම් හි සකාතය සමාජයේ උව මනාකරුවන් කරා යන්නේය. අන් ආගම්වල පරිදි ආගම් වාදීන්ට පමණක් සීමාවූ එකක් නොවන්නේය.

## එම සුදුසුකමම්ලාභීන් මෙසේය.

### 1–ෆකීර් (දිළින්දා)

තම අවශ්‍යතාවයෙන් අඩ ප්‍රමාණයට වඩා අඩු ආදායම් ලබන්නා.

### 2–මිස්කීන් (දුප්පතා)

තම අවශ්‍යතාවයෙන් අඩ ප්‍රමාණයට වඩා වැඩි ආදායම් ලබන්නා. නමුදු ඔහු තමාට අවශ්‍ය සම්පූර්ණ ප්‍රමාණය නොලබයි. ඔවුන්ට මාස කීපයකට හෝ වසරකට හෝ අවශ්‍ය ප්‍රමාණය සකාතයෙන් ලබා ගෙවිය යුතුයි.

### 3–ආමිලූන් (අයකරන්නන්)

සියලු සකාතයන් එය සතු අයගෙන් අයකිරීම සඳහා පාලකයා විසින් පත්කරන ලද අය. ඔවුන් පොහොසත් අය වුවද, ඔවුන්ගේ තරාතිරම සහ ගැලපෙන කුලියක් ඔවුන්ගේ වැඩ ප්‍රමාණය අනුව ගෙවිය යුතුයි.

### 4–මුඅල්ලෆතුල් කුලූබ් (සිත් ආකර්ෂණවූවන්)

තම සමාජයේ බලවත් නායකයන්ගෙන් ඉස්ලාම් දහම වැළඳ ගැනීම හෝ මුස්ලිම්වරුන්ට හිරහැර කිරීමෙන් වැළකීම අපේක්ෂා කරන නායකයන්. මෙසේම ඉස්ලාම් දහම වැළඳගත් අයට ඔවුන්ගේ සිත් ඉස්ලාම් කෙරෙහි නැඹුරුවීම සහ ඊමාන් කෙරෙහි ස්ථිරවීම (විශ්වාසයක් ඇතිකිරීම) සඳහා සකාතය ගෙවිය යුතුයි.

## 5-රිකාබ් (වහල්ලුන්)

වහල්ලුන් නිදහස් කිරීම හා සතුරන් විසින් අත්අඩංගු වට ගන්නා ලද සිරකරුවන් නිදහස් කිරීම සඳහා සකා තයෙන් ගෙවිය යුතුයි.

## 6-ගහාරිමීන් (ණයකාරයන්)

ණයට පත්වූවන්ට ඔවුන්ගේ ණය පියවීම සඳහා සකාත යෙන් ගෙවිය යුතුයි. නමුත්, ඔහු මුස්ලිම් වරයෙකු වීම, එම ණය මුදල පියවීමට හැකියාවන් නොවීම, එම ණය පාප කාර්යයන් සඳහා නොවීම හා එය වහාම ගෙවිය යුතු ණයක්වීම යන කොන්දේසිවලට අනුකූලව පවතිය යුතුයි.

## 7-ෆීසබීලිල්ලාහ් (ජිහාදයේ යෙදෙන්නන්)

කිසියම් වැටුපකින් තොරව ඇඳහීමේ චේතනාවෙන් ජිහාද (පරිශුද්ධ යුද්ධ)යෙහි යෙදී සිටින්නන්. ඔවුන්ට සකාතය ගෙවීම හෝ ඔවුන්ට ආයුද ගැනීම සඳහා සකා තයෙන් වියදම් කිරීම කළ යුතුයි. ආගමික අධ්‍යාපනය ලබා ගැනීමද ජිහාද්ය. ආගමික අධ්‍යාපනය ලබා ගැනී මට අදහස් කරන්නාට ඒ සඳහා අවශ්‍ය මුදල ඔහු සතුව නොවන්නේනම්, එවිට අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වන මුදල පමණක් සකාතයෙන් ලබාදීමට හැක.

## 8-ඉබ්නු සබීල් (මගීන්)

තමාගේ ගම කරා යාමට අවශ්‍යවූ මුදල නොමැතිව ගම නෙහි අතර මංවූ මගියා. ඔහු තම ගමෙහි පොහොසතා වුවද තමාගේ ගම කරා යාමට අවශ්‍ය මුදල සකාතයෙන් ඔහුට ලබා දිය යුතුයි.

දේවස්ථාන ඉදිකිරීම, මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා මෙවන් කටයුතු සඳහා සකාතයෙන් වියදම් කළ නොහැක.

## සටහන:

1-වෙළඳාමට හැර මුහුදෙන් ලැබෙන මුතු, කොරල්, මාළු හා මෙවන් දේ සඳහා සකාතය නොමැත.

2-කුලි ගොඩනැගිලි, කර්මාන්තශාලා හා මෙවන් දේ සඳහා සකාතය නොමැත. නමුත් කුලියට වසරක් සම්පූර්ණ වන්නේනම්, සකාතය ගෙවිය යුතුයි. උදාහරණයක් වශයෙන් පුද්ගලයෙක් තම නිවසක් කුලියට දී කුලිය ලබයි. එම ප්‍රමාණය (කුලිය)ට හෝ එහි කොටසකට හෝ වසරක් සම්පූර්ණවී නිසාබයද ලක්වන්නේනම්, ඒ සඳහා මහු සකාතය ගෙවීම අනිවාර්යවේ.

# أحكام الأطعمة

# ආහාර පිළිබඳ නීතිරීති

අල්ලාහ් හොඳ ආහාර අනුභව කරන ලෙසත් නරක හා කිළිටු ආහාර අනුභව කිරීමෙන් වැලකී සිටින ලෙසත් තම දාසයන්ට අණකර ඇත. අල්ලාහ් එය මෙසේ පවසන්නේය.

*විශ්වාස වන්තයනි, අපි ඔබට ලබාදුන් දේවලින් පිරිසිදු දෙය (පමණක්) අනුභව කරන්න.*

*(අල්කුර්ආන් 2:172)*

තහනම් ආහාරයන් හැර අන් සියලු ආහාර හලාල්වීම, ආහාර පිළිබඳ (ඉස්ලාම් ධර්මයේ) පදනමකි. අල්ලාහ් තම විශ්වාසනීය දාසයන්ට හොඳ දෙය අනුමත කළේ, එමගින් ඔවුන් ප්‍රයෝජන ගැනීම සඳහාය. අල්ලාහ්ගේ මෙම දයාව මගින් පවන් කෙරෙහි උදව් පැතීම තහනම්ය. අල්ලාහ් තම වහලුන්ට තහනම්වූ ආහාර, පාන පිළිබඳව පැහැදිළි කර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියත වශයෙන්ම, ඔබ බල කිරීමට ලක්වන දෙය හැර තහනම්වූ (අන් සියලු) දේ ඔබට පැහැදිලිකර ඇත.*

*(අල්කුර්ආන් 6:119)*

තහනම් ලෙස පැහැදිළි නොකළ සෑම දේම අනුමතවේ. නබිනායක මුහම්මදු (සල්) තුමාද මෙසේ පවසන්නේය.

*නියතවශයෙන්ම අල්ලාහු සමහර කාර්යයන් (යුතුකම්) අනිවාර්යකර ඇත. ඒවා විනාශ නොකරන්න. තවත් සමහර කාර්යයන් සීමාකර ඇත. ඒවා ඉක්මවා නොයන්න. සමහර*

*ද්‍රව්‍යයන් තහනම් කර ඇත. ඒවා විනාශ නොකරන්න. අමතකයෙන් තොරව ඔබලාට දයාව පිණිස සමහර ද්‍රව්‍යයන් කෙරෙහි නිශ්ශබ්දව සිටී. ඒවා ගැන නොසොයන්න.*

*(මූලාශ්‍රය : තබරානි)*

අල්ලාහ් හා නබිනායක මුහම්මදු (සල්) තුමා කෑම, බීම හා ඇඳුම් පැළඳුම්වලින් තහනම් බව පැහැදිලි නොකළ දේ තහනම් කිරීම තහනම්ය. කිසිදු බාධාවන් ඇති නොකරන පිරිසිදු ආහාර සියල්ල පිරිසිදු යනු පොදු නීතියෙකි. නමුත්, මළමිනිය, ලේ, මත්පැන්, දුම්බීම හා අපිරිසිදු තැවරුනු දේ තහනම්ය. මක්නිසාද යත්, ඒවා බාධාවන් හා කිලිටු ඇති කරන දේය. මළමිනිය යනුවෙන් හැඳින්වන්නේ නීති මාර්ග යෙන් තොරව පණ වෙන්වූ ප්‍රාණීන්ය.

ආගමික නීතිරීති අනුව හෝ එසේ නැතිව කැපීමෙන් හෝ මැරීමෙන් පිටවී දුවන ලේ හරාම් (තහනම්)ය. නමුත් (නිසි පිරිදි) කැපීමෙන් පසු මස් කැබැලි අතර හා නහරවල රැඳී සිටින ලේ තහනම් නොමැත.

තහනම් නොවූ ආහාරයන් සතුන් හා පැලැටි යනුවෙන් වර්ග කරනු ලැබේ. ඒවායින් බාධාවන් නොකරන දේ තහ නම් නොමැත. එසේම සතුන්ද වර්ග දෙකකි. ඒවා පොළො වෙහි ජීවත්වන සතුන් සහ මුහුදෙහි ජීවත්වන සතුන්ය. මුහුදේ ජීවත්වන සතුන් පොදුවෙන් තහනම්කර නොමැත. එසේම මැරුනු මුහුදු සතුන් අනුමතවූ එකක් බැවින් ඒවා කැපීම කොන්දේශියක් නැත.

ඉස්ලාම් තහනම් කර ඇති පහත සඳහන් සතුන් හැර පොළොවේ ජීවත්වන අනෙකුත් සතුන් සියල්ල අනුමතය.

1-ගැමි බූරුවා.
2-ඉත්තෑවා හැර වීර දත්වලින් හපා කන සතුන්.
3-තහනම් ලැබූ පක්ෂීන් හැර අන් පක්ෂීන් අනුමතය. දඩයම් කරන නියපොතු සහිත පක්ෂි වර්ගයන් මෙයට උදාහරණවේ. මේ පිළිබඳව නබි වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

*වීර දත් සහිත සෑම සතුන්ද, නියපොතු සහිත සෑම පක්ෂීන්ද, නබි (සල්) තුමා වැලක්කුවේය.*

*(මූලාශ්‍රය : මුස්ලිම්)*

තවද රාජාලියා, ඇන්කද ලිහිනියා හා කපුටා වැනි මල කද කන පක්ෂීන්ද තහනම්ය. මක්නිසාදයත්, උන් අපිරිසිදු දේ අනුභව කරන පක්ෂීන්ය. තවද සර්පයා, මීයා, පණුවන් වැනි පිළිකුල් දේද තහනම්ය. මෙවන් සතුන් හැර සඳහන් නොකළ සතුන්ගෙන් හා පක්ෂීන්ගෙන් අශ්වයා, ගවයා, එළුවා, මටුවා, කුකුලා, කැලෑ බූරුවා, ඉත්තෑවා, පැස්බරා, හා හාවා යනාදි සතුන් අනුමතය.

මේවා අතර (ජල්ලාලා යනුවෙන් හැඳින්වන) අධික වශයෙන් අපිරිසිදු දේ ආහාරයට ගන්නා සතුන් හා පක්ෂීන් නීතියෙන් පිටවෙයි. ඒවා දවස් තුනක් රඳවාගෙන පිරිසිදු ආහාර දෙන තෙක් අනුභව කිරීම තහනම්ය. ලූණු, සුදු ලූණු වැනි පිලිකුල්මත් සුවඳ ලද දේ අනුභව කිරීම අසතුටු දායක දෙයකි. විශේෂයෙන් මස්ජිද් (දේවස්ථාන)වලට පිවිසෙන අවස්ථාවල් අසතුටුදායකය.

කවරෙක් තහනම්වූ ආහාර අනුභව කිරීම සඳහා බල පෑමට ලක්වන්නේද, මහු එලෙස අනුභව නොකළේ නම්,

තම ජීවිතයට හානි සිදුවේදැයි බියට පත්වන්නේද, තමාට බලපෑම් පවත්වෙන තෙක් (පමණක්) අනුභව කළ හැක. නමුත්, විෂබීජයන් අනුභව කළ නොහැක.

කවරෙක් වැට හෝ මුරකාරයා හෝ නොමැති, පළතුරු වත්තෙහි ඇති ගස් හෝ එයින් වැටී ඇති පළතුරු පසුකර යන්නේද, ඔහු එයින් අනුභව කළ හැක. නමුදු තමා සමග රැගෙන යා නොහැක. නමුත් ගසට නැගීම හෝ කිසියම් දෙයකින් ගසට ගැසීම හෝ නොකළ යුතුයි. නොවැළැක්විය හේතුවකින් තොරව රැස්කර ඇති දෙයින් අනුභව කිරීම තහනම්ය.

# කැපීමේ නීතිරීති

පොළවෙහි සිටින සතුන් තහනම් නොවීමට, නීති මාර්ග යෙන් කැපීම කොන්දේසියෙකි. එහෙයින් කැපීමේ ක්‍රමයද කැපීමට අවශ්‍යවන දේද දැන සිටීම අවශ්‍යයි. කැපීම යනු වෙන් හඳින්වන්නේ, අනුභව කිරීමට අනුමතවූ පොළෙවේ සිටින සතුන්ගේ උගුරු දන්ඩද ආහාර නාලයද වෙන්කිරීම මගින් කැපීම හෝ කැපීමට අපහසුවන අවස්ථාවල තුවාල කිරීමකි.

කැපීමට හැකිවන කිසියම් සතුන් නිසියාකාරව කැපී මෙන් තොරව එයින් කිසියම් දෙයක් හෝ අනුභව කිරීමට නොහැක. කුමක්නිසාදයත්, කපන නොලද සතුන් මලකඳ යනුවෙන් හැඳින්වේ.

# කැපීමේ කොන්දේසි

## 1-කැපීමට සුදුස්සා

කපන්නා බුද්ධිය ලත්, ආගම දැනගත්, මුස්ලිම් හෝ වේදකාරයා හෝ විය යුතුයි. නමුදු පිස්සා, මත්වූ තැනැත්තා හෝ හොඳ නරක නොදන්නා වයසට නොපත් ළමයා වැනි අය විසින් කපනලද දේ අනුමතකර නොමැත. මක්නිසාද යත්, මේ අයට සිහි බුද්ධිය නැති නිසා කැපීමෙහි අරමුණ ඉටු නොවන්නේය. එසේම කාෆිර්, පිළිම් වැඳුම් කාරයා, ගිනි වැඳුම් කාරයා හා මිනීවළ වැඳුම් කාරයා විසින් කපන ලද දේද තහනම්ය.

## 2-කපන ආයුධය

යකඩ, ගල් වැනි ලේ පිටත් කරන තියුණු ආයුධවලින් කැපීමට අවසර ඇත. කටු, නියපොතු හා මෙවන් දේයින් කැපීම තහනම්ය.

## 3-ගැල කැපීම

එය ප්‍රාශ්වාස නාලය, ආහාර නාලය හා පිටුපසෙහි එක් නහරයක් කැපීමවේ. කැපීම සඳහා මෙම ස්ථාන සීමා කර තිබීමට හා මෙම ආයුධ මගින් පමණක් කැපීමට හේතුව ලේ පිටත්වීමවේ. මන්දයත්, මෙම ස්ථානය නහරයන් එක් රැස්වන තැනකි. එසේම, මෙය කඩිනමින් පණ පිටවෙන ස්ථානයෙකි. එනිසා මෙමගින් මස් රසවත්ව පවතින අතර සතාටද පහසුවේවි.

දඩයම් කිරීම හා මෙවැනි අවස්ථාවල, කැපීමට නියම කර ඇති මෙම ස්ථානයේ කැපීමට අපොහොසත් වන්නේ නම්, ශරීරයේ කිසියම් ස්ථානයක හෝ තුවාල සිදුකිරීම මගින් කැපීම සිදුවෙ. බැල්ල හිරවුනු සතුන්, බර සහිත දෙයකින් පහර දෙන ලද සතුන්, උස් තැනක සිට පහළට වැටුනු සතුන්, හැප්පුනු සතුන් හා වෙනත් සතුන් මගින් හපා කන ලද සතුන් යනාදියන් කැපීමට පෙර පණපිටින් ලබාගත යුතු යන්න කොන්දේසියෙකි.

## 4-කපන්නා උසුරීම

කපන්නා කපන විට **බිස්මිල්ලාහ්** (بسم الله) යනුවෙන් උසුරිය යුතුයි. තවද, බිස්මිල්ලාහ් සමඟ **අල්ලාහු අක්බර්** (الله أكبر) යනුවෙන්ද උසුරීම සුන්නත් (සතුටුදායක)ය.

# කැපීමේ පිළිවෙළ

## අසතුටුදායක කාර්යයන්

1-නොතියුණු ආයුධවලින් කැපීම.
2-සතුන් ඉදිරියේ ආයුධ තියුණු කිරීම.
3-කිබ්ලාවට නොමුහුණලා සතාව කැපීම.
4-පණ පිටවීමට පෙර බැල්ල කැඩීම හෝ හම ගැසීම.

ගවයා හා එළුවා වම් දිසා කෙරෙහි නින්දට තබාද, ඔටු වාගේ වම් අත බැඳ සිටගෙන තබාද, කැපීම නබි මගකි. අල්ලාහ් ඉමහත් ඥානවන්තයාය.

# දඩයම් කිරීම

අවශ්‍යතාවයක් සඳහා දඩයම් කළ හැක. නමුත් සෙල්ල මට හා විනෝදයටනම් දඩයම් කිරීම අසතුටුසායකාවේ.

### දඩයම් කලායින් පසු එය අවස්ථා දෙකකට ඇතුලත්වේ.

1-පණ පිටින් අල්ලා ගැනීම. මෙම අවස්ථාවේ කැපීම අනිවාර්යවේ.

2-අපණ පිට හෝ පණ පිටවන තරමට අඩපණ පිට හෝ අල්ලා ගැනීම. මෙම අවස්ථාවේ එය අනුමතාවේ.

### කපන්නාට අයත් කොන්දේසි දඩයම් කරන්නාටද අයත්ය.

### 1-බුද්ධිය ලත් මුස්ලිම් හෝ වේදකාර් වීම.

දඩයම් කරන්නා බුද්ධිය ලත් මුස්ලිම් හෝ වෙදකාරි හෝ විය යුතුයි. පිස්සා, මත්වූ තැනැත්තා, ගිණි සහ පිළිම වැඳුම් කාරයා වැනි කාෆිර්වරුන් දඩයම් කල දේ අනුභව කිරීම මුස්ලිම් වරයෙකුට තහනමිය.

### 2-කපන ආයුධය තියුණුවෙන් තිබීම.

කපන ආයුධය ලේ ගලන සේ තියුණුවෙන් තිබිය යුතුයි. නමුත් නියපොතු හෝ දත් (වැනි විවිධ වර්ග කටු) නොවිය යුතුයි. තවද ආයුධයේ තියුණුව මගින් තුවාල කළ යුතු අතර, ආයුධයේ බරෙන් (තද කිරීමෙන්) තුවාල නොකළ යුතුයි. දඩයම් පිළිබඳ දැනුම ලද බල්ලා හා පරවියන් මගින් තුවාල කළ දේ සඳහා අවසරයක් ඇත.

දඩයමේ තුවාල කිරීමේ දැනුම යනු එයට යන ලෙස අණ කළ විට යන අතර, ආපසු පැමිණෙන ලෙස අණ කළ විට

ආපසු පැමිණෙන්නේය. එය දෙයක් දඩයම් කළේනම්, තම අයිතිකාරයා වෙත එය තොක් එය අල්ලාගෙන සිටිය යුතු අතර එය තම අවශ්‍යතාවය සඳහා දඩයම් නොකළ යුතුයි.

### 3-දඩයම් කිරීමේ චේතනාවෙන් ආයුධය යැවීම.

දඩයම් කිරීමේ චේතනාව මත ආයුධය යැවිය යුතුයි. තම අතින් ආයුධය ගිලිහී යාමෙන් දඩයමක් කළානම්, එය අනුමත නොවන්නේය. මන්සාදයත්, එහි දඩයම මහුගේ අදහසවී නොමැත. එසේම බල්ලා සියය පරිදි දඩයමක් කළානම්, අයිතිකාරයා එය තමා වෙනුවෙන් නොයැවූ නිසා එය මහුට අනුමත නොවන්නේය. පුද්ගලයෙක් දඩයමක් සඳහා එල්ල කළ නමුත් එය වෙනත් දෙයකට හෝ රංචුව කට වැදුනේනම්, ඒ සියල්ල මහුට අනුමතයවේ.

### 4-බිස්මිල්ලාහ් උසුරීම.

රතල හා තුවාල කරන දේ දඩයම සඳහා යවනවිට **බිස් මිල්ලාහ්** යනුවෙන් උසුරිය යුතුයි. තවද එය සමඟ අල්ලාහු අක්බර් යනුවෙන් උසුරීමද සුන්නත්ය.

### සටහන :

නබි මුහම්මද් (සල්) තුමා අනුමත නොකළ කාර්යයන් සඳහා බල්ලා ඇති කිරීම තහනම්ය. එතුමා අනුමත කළේ පහත සඳහන් කාර්යයන් සඳහා පමණි.

1-දඩයම් කිරීම.

2-සිවපාවන් රැක බලා ගැනීම.

3-ගොවිතැන් ආරක්ෂාකර ගැනීම.

# أحكام النكاح
# විවාහ නීතිරීති

## විවාහයේ කොන්දේසි

### 1-මනාල, මනාලියන්ගේ එකඟතාවය

කැමැති නොවන මනාලීන් විවාහ කිරීම සඳහා පිරිමින්ද මනාලයන් විවාහ කිරීම සඳහා ස්ත්‍රීන්ද බල නොකල යුතුයි. ස්ත්‍රියකගේ කැමැත්තෙන් තොරව ඇය විවාහකර දීම ඉස් ලාම් ධර්මය තහනම් කරයි. එක් ස්ත්‍රීයෙක් යම් පිරිමියෙක් විවාහවීමෙන් වැලකී සිටින්නේ නම්, පියා ඇතුළු කවරෙක් හෝ වේවා ඇයට බල නොකළ යුතුයි.

### 2-වලී - වගකිව යුත්තා

වලීවරයෙක් නොමැතිව සිදුකරන විවාහ වලංගු නොවන් නේය. කුමක්නිසාද යත්, නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

*වලීවරයෙක් නොමැති විවාහය අවලංගු වේ.*
*(මූලාශ්‍රය : තිර්මිදී හා අබූදාවූද්)*

ස්ත්‍රියෙක් සිය මතය පරිදි විවාහවුයේනම්, එම ගිවිසුමට ඇය හෝ ඇයගේ නියෝජිතයා සම්බන්ධවුවත් එම විවාහය අවලංගු වේ. මුස්ලිම් ස්ත්‍රියෙක් වෙනුවෙන් කාපිර් වරයෙක් වගකිව (වලීවීම) නොහැක. වලීවරුන් (වගකිව යුත්තන්)

නොමැති අයට එම සමාජයේ ප්‍රධානියා වලීවරයා ලෙස සිට විවාහය සිදුකළ යුතුයි.

වලී යනු වයසට පත් බුද්ධිමත් මනාලියගේ නිහතමානි ඥාතීන්ය. උදාහරණ වශයෙන් පියා, පසුව ඔහුගේ බලය ලත් නැනැත්තා, පසුව පියා පාර්ශවයෙන් සීයා, පසුව එසේම (ඉහලටම) කිට්ටුම ඥාතීන්. පසුව ඇගේ පුතා, පසුව පුතා ගේ පුතුන්, (එසේම පහළටම කිට්ටුම ඥාතීන්) පසුව ඇය ගේ එකකුස උපන් සහෝදරයා, පසුව ඇයගේ පියා පාර්ශ වයෙන් සහෝදරයා, පසුව ඇගේ එකකුස උපන් සහෝදර යාගේ පුතුන්, පසුව පියා පාර්ශවයෙන් සහෝදරයාගේ පුතුන්, පසු පියා පාර්ශවයෙන් සහෝදරයාගේ පුතුන්ගෙන් ඉතා කිට්ටුම ඥාතීන්.

පසුව ඇයගේ දෙමාපියන් පාර්ශවයෙන් ලොකු කුඩා පිය වරුන්, පසුව ඇයගේ පියා පාර්ශවයෙන් ලොකු කුඩා පිය වරුන්, පසුව ඔවුන්ගේ පුතුන්ගෙන් ඉතා කිට්ටුම අය, පසුව ඇගේ පියාගේ ලොකු කුඩා පියවරුන් පසුව ඔහුගේ පුතුන් පසුව සීයාගේ ලොකු කුඩා පියවරුන් පසුව ඔහුගේ පුතුන් යනාදි ඥාතීන්ය.

වලී වරයා විවාහයට පෙර ඇයගේ අනුමැතිය ලබා ගත යුතුයි. වලීවරයෙක් අවශ්‍යවීමේ සූක්ෂ්ම භාවයනම්, අනියම් ආශ්වාද මාර්ග වළක්වාලීමයි. මන්දයත්, නියතව දුරාචාරයේ යෙදෙන්නා 'මේ (ධනය හෝ සම්පත් හෝ වෙනත් දෙයක් හෝ) සඳහා' තමාව විවාහ කරගන්නා ලෙස ස්ත්‍රියෙකුට පවසා පසුව තම මිතුරන් හා වෙනත් අයගෙන් දෙදෙනෙක් මේ සඳහා සාක්ෂි කරුවන් ලෙස ගෙන ඒමට හැක.

## 3-සාක්ෂීන්

විවාහ ගිවිසුමේ නිහතමානි මුස්ලිම් පිරිමින් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සාක්ෂිකරුවන් ලෙස සහභාගි විය යුතුයි. ඔවුන් දුරාචාරයේ යෙදීම, මත්පැන් පානය කිරීම හා මෙවන් මහා පාපයෙන් වැළකී සිටින්නන් විය යුතුයි.

විවාහ ගිවිසුමෙහි **ප්‍රකාශය** යනුවෙන් හැඳින්වන්නේ, මනාලයා හෝ මහුගේ නියෝජිතයා 'ඔබගේ දියණිය හෝ ඔබට වගකීම් පවරණලද නැනැත්තිණිය මාහට විවාහකර දෙන්න' යනුවෙන්ද, එයට වලීවරයා, 'මාගේ දියණිය, හෝ මාහට වගකීම් පවරන ලද නැනැත්තිණිය ඔබට විවාහකර දුන්නෙමි' යනුවෙන්ද, පසුව මනාලයා 'ඇයගේ විවාහය මා පිළිගන්නෙමි' යනුවෙන්ද ප්‍රකාශ කිරීමකි. මනාලයා තමා කැමති අය තමාගේ නියෝජිතයා ලෙස නියම කළ හැක.

## 4-මහරය ගෙවීම

(**මහර්** යනු මනාලයා මනාලියට අනිවාර්යයෙන් දිය යුතු තෑග්ගකි) මහර් පිළිබඳ නීතිය එය ස්වල්පයෙන් පවතීමකි. ස්වල්පයෙන් පවතින හා පහසුවෙන් ලබන සෑම දේ මෙයට උතුම්ය. එය සදාක් යනුවෙන්ද හැඳින්වෙ. විවාහ ගිවිසුමේදී එය සඳහන් කිරීමද, එය ගිවිසුම්කළ විගස ගෙවීමද සුන් නත්ය. නමුදු එය හෝ එයින් කොටසක් කලකට ප්‍රමාදකළ හැක. සැමියෙක් ඇය සමග සංසර්ගයේ යෙදීමට පෙර දික් කසාදවූයේද, එවිට මහරයෙන් අඩක් ලබාගත හැක. විවාහ ගිවිසුම්කළ පසු සංසර්ගයේ යෙදීමට පෙර සැමියා මරණයට පත්වූයේනම්, ඇයට මහරය හා හිමිකම් සියල්ලම හිමිවෙ.

# විවාහයේ පල ප්‍රයෝජන

## 1-වියදම් කිරීම

සැමියා තම බිරිඳට සාමාන්‍ය පැවැත්ම පරිදි ආහාර පාන, ඇඳුම් පැළඳුම් හා නවාතැන් පහසුකම් යනාදීන් සපයා දීම අනිවාර්යයවේ. මෙම අනිවාර්ය කාර්ය කිසිවක් හෝ සැපයී මට ඔහු ලෝභ කරන්නේ නම්, ඔහු පාපකාරයාය. එසේම ඔහුගේ මුදලින් තමාට අවශ්‍ය ප්‍රමාණයක් ගැනීමට හා ඔහු වෙනුවෙන් ණය ලබාගැනීමට ඇයට හැකිවේ. පසුව එය ඔහුම ගෙවිය යුතුයි. වලීමා සඳහාද ඔහු වියදම්කළ යුතුයි. මනාලයා විසින් තම විවාහය නිමිත්තෙන් ආහාර පිළියෙළ කර, ඒ සඳහා මිනිසුන් කැඳවා කරන භෝජන සංග්‍රහය වලීමා යනුවෙන් හැඳින්වේ. මෙය නබිනායක මුහම්මදු (සල්) කළ හා අණ කළ සුන්නත් නම්වූ සතුටුදායක කරුණකි.

## 2-හිමිකම් ලැබීම

පුද්ගලයෙක් කවර දිනකදී ස්ත්‍රියෙකු හා සමග නිවැරදි විවාහ ගිවිසුමක් කර ගත්තේද, එදින සිට ඔවුන් දෙදෙනා අතර හිමිකම් කීපයක් ඇතිවේ. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

*තවද, ඔබලාගේ බිරිඳන් අතහැර ගිය දෙයින් ඔවුන්ට දරුවන් නොවන්නේනම්, ඔබලාට අඩක් තිබේ. ඔවුන්ට දරු වන් සිටින්නේනම්, ඔවුන් අතහැර ගිය දෙයින් ඔබලාට හත රෙන් එක පංගුවෙකි. (එයද,) ඔවුන් කළ මරන සාසනය (අවසන් කැමැත්ත) හා ණය පියවීමෙන් පසුය. තවද, ඔබ ලාට දරුවන් නොවන්නේ නම්, ඔබලා අතහැර ගිය දෙයින්*

ඔවුන්ට හතරෙන් එක පංගුවෙකි. ඔබලාට දරුවන් සිටින් නේනම්, ඔබලා අතහැර ගිය දෙයින් ඔවුන්ට අටෙන් එක පංගුවෙකි. (එයද) ඔබලා කළ මරන සාසනාය හා ණය පිය වීමෙන් පසුය. (අල්කුර්ආන් 4:12)

# සුන්නත් හා පිළිවෙල්

1- විවාහය පිළිබඳව තම ඥාතීන් හා මිතුරන්ට දැනුම් දීම සුන්නත් නම්වූ නබි මගක් වන අතර, ඔවුහුද මනාල මනාලීන් දෙපලට ප්‍රාර්ථනා කිරීමද නබිමගකි. එබැවින්, මනාලයාට හෝ මනාලියට මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

بَارَكَ اللهُ لَكَ وَبَارَكَ عَلَيْكَ وَجَمَعَ بَيْنَكُمَا فِي خَيْرٍ

***බාරකල්ලාහු ලක, වබාරක අලෛක, වජමඅ බෛනකුමා ෆී (ක්)ඛෛරින්.***

(අල්ලාහ් ඔබට අභියන්තරව හා බාහිරව ආශීර්වාදය කරනු මැන. ඔබ දෙපළ යහමගහි එකතු කරනු මැන)

2- සංසර්ගයේ යෙදීමට පෙර ඔවුන් දෙදෙනා මෙසේ කීම සුන්නත්ය.

بِسْمِ اللهِ، اَللّٰهُمَّ جَنِّبْنَا الشَّيْطَانَ وَجَنِّبِ الشَّيْطَانَ مَا رَزَقْتَنَا

***බිස්මිල්ලාහි අල්ලාහුම්ම ජන්නිබ්නශ් ශෛතාන වජන්නිබිශ් ශෛතාන මා රසක්තනා.***

අල්ලාහ්ගේ නාමයෙනි. (මෙහි යෙදෙන්නෙමි) ස්වාමිනි, අපහට හා අපට ලබා දෙන දරුවාට ෂාතාන්ගේ උවදුරු වලින් රැකවරණය ලබා දෙනු මැනවි.

3-ඔවුන් දෙදෙනා අතරේ සිදුවන සංසර්ගය පිළිබඳ කරුණු පැතිරවීම පිළිකුල් කාර්යයෙකි.

4-තම බිරිඳ ඔසප්වී සිටින හෝ දරු ප්‍රසූත රුධිරයේ සිටින සමයේ සැමියා ඇය සමග සංසර්ගයේ යෙදීම තහනම් (හරාම්)ය. එයින් පිරිසිදුවී ජල ස්නානය කිරීමට පෙරද ඇය සමග සංසර්ගයේ යෙදීම හරාමිය.

5-සැමියා තම බිරිඳගේ පිටු පස ගුද මාර්ගයෙන් ලිංගික ආශ්වාදයෙහි යෙදීම තහනම්ය. එය ඉස්ලාම් තහනම් කළ මහා පාප ක්‍රියාවකි.

6-සැමියා සංසර්ගයේදී තම බිරිඳට ඇයගේ සම්පූර්ණ අයිතිය ලබා දීම අනිවාර්යය වේ. එසේම ඇයගේ අනුමැතියෙන් හා නොවැළක්විය හේතුවෙන් තොරව ගැබ් හට නොගැනීම සඳහා අස්ල් (සංසර්ගයේ යෙදී ධාතු මෝචන වන අවස්ථාවේ පුරුෂ ලිංගය පිටතට ගෙන ධාතු ඇතුල් ගත නොවන සේ පිට දැමීම) කළ නොයුතුයි.

# මනාලියගේ ගුණාංග

විවාහය සිදුකරනු ලබන්නේ ප්‍රීතිය අනුභව කිරීම සහ හොඳ පවුලක්, හොඳ සමාජයක් බිහි කිරීම සඳහාය. එම නිසා මෙම අරමුණු දෙකම සම්පූර්ණයෙන් යුත් ස්ත්‍රියෙක් විවාහ කිරීම අවශ්‍යයි.

ඇය බාහිර හා අභ්‍යන්තර සෞන්දර්යට ලක්වන්නෙකි. බාහිර ලස්සනය යනුවෙන් හැඳින්වන්නේ එය රූපයේ සම්පූර්ණවීමකි. අභ්‍යන්තර ලස්සනය යනුවෙන් හැඳින්වන්නේ එය ධර්මයෙන් හා ගුණාංගයෙන් සම්පූර්ණවීමකි. නියතව

බාහිරව හා අභ්‍යන්තරව ලස්සනෙන් යුත් ස්ත්‍රියෙකු ලබා ගැනීමට හැකිවන්නේනම්, එය ඇත්ත වශයෙන්ම අල්ලාහ් ගේ භාග්‍යයන් අතර සම්පූර්ණ භාග්‍යයවේ. එසේම බියබැති කමෙන් යුත් යහපත් පුරුෂයෙකු විවාහ කිරීම සඳහා ස්ත්‍රිය ඇල්ම විය යුතුයි.

# තහනම් ස්ත්‍රීන්

ස්ත්‍රීන්ගෙන් විවාහ කිරීමට තහනම්වූ අය කොටස් දෙක කින් සමන්විතකි. කොටසක් විවහ කිරීම සඳහා සදාකාලි කව තහනම්වූ අය. අනෙක විවාහ කිරීම සඳහා තාවකාලි කව තහනම්වූ අය.

## අ)-සදාකාලිකව තහනම් අය

විවාහ කිරීමට සදාකාලිකව තහනම්වූ ස්ත්‍රීන් කොටස් තුනකට බෙදේ.

### 1-ඥාති කමින් තහනම් වීම

ඔවුහු හත් දෙනෙකි. ඔවුන් පිළිබඳව අල්ලාහ් මෙසේ පව සන්නේය.

*ඔබලාගේ මවවරුන්ද, ඔබලාගේ දියණියන්ද, ඔබලාගේ සහෝදරියන්ද, ඔබලාගේ නැන්දම්මලාද, ඔබලාගේ කුඩා හා ලොකු අම්මලාද, ඔබලාගේ සහෝදරයන්ගේ දියණියන්ද, ඔබලාගේ සහෝදරියන්ගේ දියණීන්ද විවාහ කිරීම ඔබලාට තහනම්ය.*

(*අල්කුර්ආන්*- 4:23)

(අ)-මව්වරුන් යනු, මව සහ පියා හෝ මව පාර්ශවයෙන් ආත්තලා.

(ආ)-දියණියන් යනු, තමන්ගේද, තම පුතුන්ගේ හා දියණි යන්ගේද දියණියන් හා එසේම පහළට එන අය.

(ඉ)-සහෝදරියන් යනු, එක කුස උපන් සහෝදරියන්, හා පියා සහ මව පාර්ශවයේ සහෝදරියන්ය.

(ඊ)-නැන්දම්මලා යනු, තමාගේ නැන්දම්මලා, තම පියාගේ නැන්දම්මලා, තම මුත්තාගේ නැන්දම්මලා, තම මවගේ නැන්දම්මලා හා තම ආත්තාගේ නැන්දම්මලාය.

(උ)-කුඩම්මා සහ ලොකු අම්මා යනු, තමාගේද, තම පියා ගේද, තම පියාගේ පියාගේද, තම මවගේද, තම මවගේ මවගේද ලොකු කුඩා අම්මලාය.

(ඌ)-සහෝදරයාගේ දියණියන් යනු, එක කුස උපන් සහෝ දරයාගේද, පියා හා මව පාර්ශව සහෝදරයාගේද, ඔවුන් ගේ පුත්තුන් සහ දියණියන්ගේද, මෙසේ පහළටම එන දියණියන්ය.

(එ)-සහෝදරියගේ දියණියන් යනු, තම එක කුස උපන් සහෝදරියන්ගේද, පියා හා මව පාර්ශව සහෝදරියගේද, ඔවුන්ගේ පුතුන්ගේ හා දියණියන්ගේද, එසේම පහළටම එන දියණියන්ය.

## 2-කිරි බීමෙන් තහනම් වීම

ඔවුන්ද පදාතිකමින් තහනම් අය සේ සැළකේ. මේ ගැන නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

*පදාතිකමින් තහනම්වන සැම දෙනා කිරිබීමෙන්ද තහ නම්වේ.* (මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

නමුත්, කිරි බීමෙන් තහනම්වීම පහත සඳහන් කොන්දේසිවලට යටත්විය යුතුයි.

(අ)-පස් වතාවක් හෝ එයට අධිකව කිරි බී තිබිය යුතුයි. ළදරුවෙකු ස්ත්‍රියෙකුගෙන් සතර වතාවක් කිරි බී තිබේ නම්, ඔහුට ඇය මවක් නොවන්නේය.

(ආ)-කිරි බීම කිරි වැරීමට පෙර තිබිය යුතුයි. එනම් කිරි බීමෙහි පස් වතාවන් සියල්ලම කිරි වැරීමට පෙර තිබිය යුතුයි. කිරි බීම කිරි වැරීමෙන් පසුව හෝ කිරි වැරීමට පෙර සමහර වතාවන් හා කිරි වැරීමෙන් පසු සමහර වතාවන් සිදුවූයේනම්, එවන් ස්ත්‍රිය ඔහුට මවක් නොවන්නේය. කිරි බීමෙහි කොන්දේසි සම්පූර්ණවන්නේ නම්, ළදරුවා එම ස්ත්‍රියට පුත්‍රයාය. ඇයගේ පුත්‍රයන් ඔහුට පෙර හෝ පසු උපන් අය වුවද ඔහුට සහෝදරයන්ය. එසේම ඔහු සමග කිරි බීපු අයද, ඔවුහු ඔහුට කිරි දුන් ස්ත්‍රියගේ හෝ අන් අයගේ හෝ වේවා ඔහුට සහෝදරයන්ය. මෙහි කිරි බීපු අයගේ දරුවන් හැර වෙන කිසිවෙකුට මෙහි සම්බන්ධයක් නැති බව දැනගත යුතුයි. ඔවුන් කෙරෙහි කිසියම් බාධාවන් නොපවති.

## 3-විවාහ මාර්ගයෙන් තහනම් වීම

### *(අ)-පියාතන් හා මුත්තන්ගේ බිරිඳන්*

පුද්ගලයෙක් ස්ත්‍රියෙක් සමග විවාහ ගිවිස ගත්තේනම්, ඇයට ඔහුගේ පුතුන්, පුතුන්ගේ පුතුන්, ඔහුගේ දියණියගේ පුතුන් සහ එසේම පහළට එන කිසියම් දෙනෙකුව විවාහ කිරීම තහනම්ය. ඔහු ඇය සමග සංසර්ගයේ යෙදුනා හෝ නොයෙදුනා හෝ වේවා තහනම්ය.

### (ආ)-පුතුන්ගේ බිරිඳන්

පුද්ගලයෙක් ස්ත්‍රියක සමග විවාහ ගිවිසුම්කර ගත්තේ නම්, එවිගසම මහුගේ පියාට සහ මුත්තාට ඇයව විවාහ කිරීම තහනම්ය. තවද පියා හෝ මව පාර්ශවයෙන් පරම්පරා කොපමණ ඉහළට ගියත්, එම විවාහ ගිවිසුම අනුව, මහු ඇය සමග සංසර්ගයේ නොයෙදුනත්, ඇයව විවාහ කිරීම තහනම්ය.

### (ඉ)-බිරිඳගේ මව හා ආත්තලා

පුද්ගලයෙක් ස්ත්‍රියෙක් සමග විවාහ ගිවිස ගත්තේනම්, එවිටම මහු ඇය සමග සංසර්ගයේ නොයෙදුනත්, ඇයගේ මව සහ ආත්තලා විවාහ ගිවිසුම අනුව තහනම්ය. එවැනි ආත්තලා මව හෝ පියා පාර්ශවයෙන් විය හැක.

### (ඊ)-බිරිඳගේද, ඇගේ පුතුන් හා දියණීන්ගේද දියණියන් හා මෙසේම පහළටම එන ස්ත්‍රීන්.

පිරිමියෙක් ස්ත්‍රියකු සමග විවාහවී ඇ සමග සංසර්ගයේ යෙදෙන්නේනම්, එවිට ඇගේ දියණියන්, ඇගේ පුතුන්ගේ දියණීන්, ඇගේ දියණියන්ගේ දියණීන් හා මෙසේ පහළට එන ස්ත්‍රීන් මහුට තහනම්ය. ඔවුන් මහුට පෙර විවාහයෙන් හෝ මහුට පසු විවාහයෙන් හෝ විය හැක. නමුත් සංසර් ගයේ යෙදීමට පෙර ඔවුන් දෙදෙනා අතර වෙන්වීම් ඇතිවූ යේනම් තහනම් නොවන්නේය.

## ආ)-තාවකාලිකව තහනම් අය

විවාහ කිරීම සඳහා තාවකාලිකව තහනම්වූ අය පහත සඳහන්වේ.

### (අ)-බිරිඳගේ සහෝදරිය, නැන්දම්මලා හා ලොකු කුඩා අම්මලා.

බිරිඳගේ මරණය හෝ ජීවිතයෙන් වෙන්වී ඉද්දා කාලය අවසන්වන තෙක් මෙම අය විවාහ කිරීම තහනම්ය.

### (ආ)-කෙනෙකු වෙනුවෙන් ඉද්දාවෙහි සිටින අය.

ඇගේ ඉද්දා කාල සීමාව අවසන්වන තෙක් ඇයව විවාහ කිරීම තහනම්ය. එසේම ඇගේ ඉද්දා කාලය අවසන්වෙන තෙක් ඇගේ විවාහය ගැන සාකච්ඡා කිරීමද තහනම්ය.

### (ඊ)-හජ් හා උම්රා මගින් තහනම වීම.

ඉහ්රාමයෙන් සිට මිදෙන තෙක් ඇය සමඟ විවාහ ගිවිසුම් කිරීම තහනම්ය.

## දික්කසාදය

දික්කසාදවීම මූලිකයෙන්ම අසතුටුදායක ක්‍රියාවෙකි. එනමුත්, බිරිඳ තම සැමියා සමඟ එක්ව ජීවත්වීමෙන් ඇය වේදනාවට ලක්වීම හෝ සැමියා තමාගේ බිරිඳ සමඟ ජීවත් වීමෙන් ඔහු වේදනාවට ලක්වීම හෝ මෙවැනි කාරණාවන් සඳහා දික්කසාද වීමට අනුමැතිය ලැබීම අල්ලාගේ කරුණාවෙන් යුත් දෙයකි.

කෙනෙක් තම බිරිඳට අකැමැති වී එය ඉවසා ගැනීමට නොහැකි වූයේනම්, ඇයව දික්කසාද කිරීම වරදක් නොවන්නේය. එනමුත්, පහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීම අනිවාර්යවේ.

1-ඇය මාසික ශුද්ධියේ පසුවන අවස්ථාවේ දික්කසාද කළ නොයුතුයි. එසේ ඇය මාසික ශුද්ධියේ පසුවන අවස්ථාවේ දික්කසාද කළේනම්, ඔහු අල්ලාහ්ටත් ඔහුගේ රසූල් වරයාටත් විරුද්ධ වත්තයාවේ. එසේම ඔහු තහනම් කාර්යයක් කළ බවට සැලකේ. එවිටම ඇයව ආපසු ලබාගැන ඇය පිරිසිදුවන තෙක් තම ලඟ තබා ගැනීම ඔහුට අනිවාර්යවේ. පසුව කැමතිනම් දික්කසාදය කළ හැක. ඇයට දෙවැනි වරටත් මාසික ශුද්ධිය ඇති වෙන තෙක් නිදැල්ලේ ඇරීම ඉතා සතුටුදායකවේ. ඇය පිරිසිදුවීමෙන් පසු කැමැති නම් ඇය සමග ජීවත්විය හෝ දික්කසාද විය හැක.

2-සුද්ධව සිටියදී ඇය සමඟ සංසර්ගයේ යෙදී, ඇය ගැබ්වී සිටීම පැහැදිලිවීමට පෙර දික්කසාදය කළ නොයුතුයි. තම බිරිඳගෙන් දික්කසාදය වීමට අධිටන්කර සිටින පුද්ගලයෙක්, ඇයගේ මාසික ශුද්ධියෙන් පසු සංසර්ගයේ යෙදුනේනම්, ඇයට නැවත මාසික ශුද්ධිය ඇතිවී එයින් පිරිසිදුවන තෙක් (කාලය දීර්ගවුවත්) දික්කසාදය කළ නොහැක. පසුව කැමැති නම් ඇය සමග සංසර්ගයේ යෙදීමට පෙර දික්කසාද කළ හැක. ඇයගේ ගැබ් තත්වය පැහැදිලිවූයේනම් හෝ ඇය ගැබ්වී සිටියේනම්, දික්කසාද වීමෙන් ප්‍රශ්නයක් නොමැත.

# දික්කසාදය පිළිබඳ කාර්යයන්

පුද්ගලයෙන් සිය බිරිඳගෙන් වෙන්වීම දික්කසාදය යනුවෙන් හැඳින්වේ. එබැවින්, මෙම වෙන්වීම පිළිබඳව අධික නීතිරීතීන් පමුණුවා ඇත. ඒවා මෙසේය.

## 1-ඉද්දාවෙහි පසුවීම

සැමියා සිය බිරිඳ සමග සංසර්ගයේ යෙදීමෙන් හෝ ඇය සමග තනියම සිටීමෙන් පසු දික්කසාද වූයේනම්, ඇය ඉද් දාවෙහි සිටීම අනිවාර්යවේ. ඇය සමග සංසර්ගයෙහි යෙදී මටත්, තනියේ සිටීමටත් පෙර දික්කසාද වූයේනම්, ඉද්දා වෙහි පසුවීම අනවශ්‍ය වේ. මාසික ශුද්ධිය ඇතිවන ස්ත්‍රීන් නම් මාසික ශුද්ධි තුනක්ද, මාසික ශුද්ධිය ඇති නොවන ස්ත්‍රීන් නම්, මාස තුනක්ද ඉද්දාවෙහි සිටිය යුතුයි. ගැබිණි ස්ත්‍රීන් නම්, දරු ප්‍රසූතවන තෙක් ඉද්දාවෙහි සිටිය යුතුයි. ඉද්දාවේ සූක්ෂ්මය, දික්කසාදය කළ බිරිඳ නැවත ලබාගැනී මට සැමියාට අවස්ථාවක් සලසා දීමකි. එසේම ඇය ගැබ්වී සිටින්නේද, නොවන්නේද යන බව සනාථකර ගැනීමටය.

## 2-බිරිඳ තහනම් වීම

සැමියෙක් තම බිරිඳව තුන් වතාවක් දික්කසාද කළේ නම්, ඔහුට බිරිඳ සමග ඇති සම්බන්ධතාවය තහනම්වේ. එනම්, සැමියා තම බිරිඳව දික්කසාද කර, ඇය ඉද්දාවෙහි පසුවන කාලයේ නැවත කැඳවා ගැනීම හෝ ඉද්දා අවසන් වීමෙන් පසු විවාහකර ගැනීම, පසුව එසේම දෙවන වරටත් දික්කසාදය කර, ඇය ඉද්දාවෙහි පසුවන කාලයේ නැවත කැඳවා ගැනීම හෝ ඉද්දා අවසන් වීමෙන් පසු විවාහ කර ගැනීම, පසුව එසේම තුන්වන වරටත් ඔහු ඇයව දික්කසාද කළේනම්, වෙනත් පුද්ගලයෙකු ඇයව විවාහකර, ඔහු ඇය සමග සංසර්ගයේ යෙදී පසුව ඔහු ඇයට අකැමැතිවී, ඇයව දික්කසාද කළායින් පසු (පමණක්) පළමුවන සැමියාට ඇය අනුමත වේ.

තුන් වතාවක් දික්කසාද කළ සැමියාට ඇය තහනම්කර තිබීම, සැමියන් මවුන්ගේ බිරිඳන්ට කරන අපරාධය වෙනු වෙන් ස්ත්‍රීන්ට අල්ලාහ් ලබාදෙන කරුණාවකි.

# (ක්)හුල්උ

තම සැමියාට කැමැති නොවන ස්ත්‍රියෙක් තමාගෙන් මහු වෙන්වී යාම සඳහා මහුට යම් මුදල් ප්‍රමාණයක් ලබාදී මහුගෙන් වෙන්වීම ඉල්ලා සිටීම ක්හුල්උ යනුවෙන් හැඳින් වේ. නමුදු, කැමැති නොවන්නා සැමියානම්, මහු වෙන්වීමට අදහස් කළේනම්, ඇයගෙන් කිසියම් වන්දියක් හෝ ලබා ගැනීමට මහුට අයිතියක් නොමැත. මහු කැමැතිනම්, ඇය කෙරෙහි ඉවසා සිටිය යුතුයි. නැතිනම්, දික්කසාදය කළ යුතුයි.

ස්ත්‍රියෙක් තම සැමියා තමාට කරන වද හිංසා ඉවසීමට නොහැකි තරම් වේදනාවට ලක්වී, මහු සමඟ ජීවත් වීමට ඇයට ඉවසීමක් කළ නොහැකි නම් පමණක් මහුගෙන් වෙන්වීමට (ක්)හුල්උ ඉල්ලා සිටිය හැක. එසේම සැමියා තම බිරිඳ තමාගෙන් (ක්)හුල්උ ඉල්ලන තෙක් වද කිරීමෙහි මුරණ්ඩුවී සිටිය නොහැක. සැමියා තමා බිරිඳට දුන් මහර් ප්‍රමාණයට වඩා ලබා නොගැනීම සතුටුදායක දෙයකි.

# විවාහයේ හා වෙන්වීමේ අයිතිය

කිසියම් හේතුන් මත තම විවාහ ගිවිසුමෙහි නිරතවී සිටී මට හෝ එයින් වෙන්වීමට හෝ සැමියා හා බිරිඳ දෙදෙනා ටම හිමිකම් ඇත. උදාහරණයක් වශයෙන් විවාහ ගිවිසුමේදී

(සාකච්ඡාවේදී) පැහැදිළි නොකළ රෝගයක් හෝ ස්වභාවික ඌනතාවයක් සැමියා තම බිරිඳගෙන් හෝ බිරිඳ තම සැමියාගෙන් හෝ දුටුවානම්, ඔවුන් දෙදෙනාටම එම විවාහයෙහි රැඳී සිටීමට හෝ එයින් වෙන්වීමට හෝ හැක.

## 1-කෙනෙකුට පිස්සු වැටීම හෝ විවාහයේ සම්පූර්ණ අයිතිවාසිකම අනෙකුට නැතිවීම යනාදි තරමට අසනීපයෙන් පෑලීම.

එම අවස්ථාවෙ අනෙක් තැනැත්තාට විවාහයෙන් වෙන් වීමේ අයිතිය හිමිවේ. එය සංසර්ගයේ යෙදීමට පෙර සිදුවන්නේනම්, සැමියා තමා පිරිනැමූ මහරය ආපසු ලබා ගැනීමට හැක. එය සංසර්ගයේ යෙදීමෙන් පසු සිදුවෙන්නේ නම්, කිසියම් දෙයක් ආපසු ලබා ගත නොහැක. අඩුපාඩු දැන ගැනත් රැවට්ටීමට ලක්වූ අයට මහරය ආපසු ගත හැක යනුවෙන්ද අදහසක් පවති.

## 2-මහරය පිරිනැමීමට අපොහොසත්වීම.

මහරය පිරිනැමීමට සැමියා අපොහොසත් වන්නේ නම්, සංසර්ගයේ යෙදීමට පෙර බිරිඳට වෙන්වීමේ අයිතිය හිමිවේ. නමුදු, සංසර්ගයේ යෙදීමෙන් පසු ඇයට මේ සඳහා කිසියම් අයිතියක් නොමැත.

## 3-වියදම (නඩත්තු) කිරීමට අපොහොසත්වීම.

සැමියා තම බිරිඳ නඩත්තු කිරීමට අපොහොසත් වන්නේ නම්, බිරිඳ ඉවසිය යුතු තරම් කාලයක් බලාපොරත්තුවිය යුතුයි. පසුව ඇයට උසාවයේ පිහිට පතා නීතියානුකූලව වෙන්වීමේ අයිතියක් හිමිවේ.

**4-සැමියා අතුරුදහන් වීම.**

සැමියා අතුරුදහන්වී මහු සිටින තැනද සොයාගැනීමට නොහැකිවිය. මෙවන් අවස්ථාවක මහු තම බිරිඳ වෙනුවෙන් වියදම් කිරීමට කිසිදෙයක් තබා නොගියේ නම්, ඇයගේ වියදම සඳහා කිසියම් කෙනෙකුට හෝ නොපවසා ගියේ නම්, ඇය වෙනුවෙන් වියදම් කිරීම සඳහා කවරෙක් හෝ ඉදිරිපත් නොවූයේනම්, ඇය වෙනුවෙන් වියදම්කර එය තම සැමියාගෙන් ලබාගැනීම සඳහා කවරෙක් හෝ තමා අතර නොවන්නේනම්, ඇයට නීති මාර්ගයෙන් වෙන්වීමට අයිති යක් ඇත.

# මුස්ලිම් නොවන්නන් විවාහ කිරීම

මුස්ලිම් පිරිමියෙකුට වෙදකාරීන් හැර කාෆිර් ස්ත්‍රියෙක් විවාහ කිරීම තහනම්ය. මුස්ලිම් ස්ත්‍රියෙකුට වේදකාර හෝ වෙදකාර නොවන හෝ මුස්ලිම් නොවන පිරිමියෙකු විවාහ කිරීමද තහනම්ය. බිරිඳෙක් තම සැමියාට පෙර ඉස්ලාමය වැළඳ ගත්තේ නම්, තම සැමියාද ඉස්ලාමය වැළඳ ගන්නා තෙක් තමා සමග ආශ්වාදයෙහි යෙදීම සඳහා බිරිඳ මහුට ඉඩ නොදිය යුතුයි.

**මුස්ලිම් නොවන්නන් විවාහ කිරීම පිළිබඳ සමහර නීතිරීතීන් පහත සඳහන්වේ.**

1-සැමියා සහ බිරිඳ යන දෙදෙනාම ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තේ නම්, මවුන් තම පැරණි විවාහයේම සිටිය හැක. නමුදු, බිරිඳ සැමියාට තහනම්වූ ස්ත්‍රියෙක්වීම හෝ ඇයව විවාහ කිරීම මහුට අනුමත නොවීම වැනි ආගමික නීති

යෙන් කිසියම් බාධාවක් නොවිය යුතුයි. එසේ බාධාවන් පවතීනම්, මවුන් අතර වෙන්වීම ඇතිකළ යුතුයි.

2-වෙදකාරියෙකුගේ සැමියා ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තේ නම්, ඔවුන් දෙදෙනා එම විවාහයේම සිටිය හැක.

3-වෙදකාරයන් නොවන සැමියා හා බිරිඳ යන යුවළ අතර කෙනෙකු සංසර්ගයෙහි යෙදීමට පෙර ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තේ නම්, ඔවුන්ගේ විවාහය නිශ්ඵලවේ.

4-මුස්ලිම් නොවන (වෙදකාර හෝ වෙනත්) සැමියෙකුගේ බිරිඳ සංසර්ගයේ යෙදීමට පෙර ඉස්ලාමය වැළඳ ගත්තේ නම්, ඇගේ (පැරණි) විවාහය නිශ්ඵලවේ. මන්ද, මුස්ලිම් ස්ත්‍රියෙක් කාෆිර්වරයෙකුට (බිරිඳවීම) තහනම්ය.

5-කාෆිර්වරයෙකුගේ බිරිඳ සංසර්ගයේ යෙදීමෙන් පසු ඉස් ලාම් ධර්මය වැළඳ ගත්තේ නම්, ඇය තම ඉද්දා කාලය අවසන්වන තෙක් එසේම සිටිය යුතුයි. ඉද්දා කාලය අව සන් වීමෙන් පසු, සැමියා ඉස්ලාම් ධර්මය වැළඳ නොගත් තේනම් විවාහය නිශ්ඵල වේ. ඇයට තමා කැමැති අය විවාහකර ගැනීමට හැක. ඇය ඔහුට කැමැති වන්නේ නම්, ඔහු ඉස්ලාම් ධර්මය වැළඳ ගන්නා තෙක් ඉවසා සිටිය හැක. නමුත් එම කාලය තුල ඇයට ඔහු පිළිබඳ කිසියම් අයිතියක් හෝ නොමැත. එසේම ඔහුට ඇය කෙරෙහි නීතියානුකුල අයිතියක්ද නොමැත.

ඔහු ඉස්ලාමය වැළඳ ගත්තේනම්, ඇය අවුරුදු කීපයක් බලා සිටියත්, විවාහය අලුත් කිරීමකින් තොරව ඔහුට ඇය බිරිඳවේ. වෙදකාරීන් නොවන ස්ත්‍රියෙකුගේ සැමියා ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තේ නම්, ඔවුන් අතරද නීතිය එසේම පවතී.

6-සංසර්ගයේ යෙදීමට පෙර බිරිඳ ඉස්ලාම් ධර්මයෙන් පලා ගියේනම්, විවාහය නිශ්ඵලවේ. ඇයට මහර් නොහිමිවේ. සැමියා ඉස්ලාම් ධර්මයෙන් පැහැර ගියේ නම්, විවාහය නිශ්ඵලවේ. ඔහුට මහරෙහි අඩක් හිමිවේ. එම දෙදෙනා ගෙන් ඉස්ලාම් ධර්මයෙන් පැහැර ගිය තැනැත්තා ඉස් ලාම් ධර්මය (නැවත) වැළඳ ගත්තේනම්, ඔවුන් දෙදෙ නාම ඔවුන් අතර දික්කසාදයක් නොවන තුරු පළමුවන විවාහයේම සිටිය හැක.

# වේදකාරීන් විවාහ කිරීමේ පළ විපාක

අල්ලාහ් විවාහය අනුමත කළේ, ශීලාචාර ගුණාංග ඇති කිරීම, හීන ගුණාංගයෙන් සමාජය පවිත්‍ර කිරීම, කන්‍යා භාවය සුරැකීම, සමාජයෙහි පිරිසිදු ඉස්ලාමීය පරිසරයක් ගොඩනැගීම හා 'වැඳුම් පිදුම් කිරීමට සුදුසු දෙවියා අල්ලාහ් බවත්, මුහම්මද් නබිතුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දරණ' මුස්ලිම් සමාජයක් බිහිකිරීම වැනි අරමුණු උදෙසාය. මෙම ශීලාචාරය හා සත් ගුණධර්මයන් අඩංගු ගෞරවණීය ධර්මය පිළිපදින ස්ත්‍රියක් විවාහ කිරීමෙන් තොරව නොසිදු වේ. නමුදු, මුස්ලිම්වරුන් වේදකාරී ස්ත්‍රීන් විවාහ කිරීමෙන් සිදුවෙන පළ විපාක (කෙටියෙන්) පහත දැක්වේ.

## 1-පවුලෙහි බලපාන හානිය

පුංචි පවුළක සැමියා බලවතා ලෙස සිටියේනම්, එය සිය බිරිඳගේ ස්වභාවයෙන් වෙනසක් ඇති කරයි. එමගින් ඇය ඉස්ලාමය වැළඳ ගනී. එනමුත්, සමහරවිට එයට පටහැනිව සැම දේ සිදුවේ. එකළ, බිරිඳ ඉස්ලාමය හැර තම ධර්මයේ

රැඳී සිට, මත් පැන් පානය කිරීම, ඌරු මස් අනුභව කිරීම, රහස් ඇසුරුකම් පැවැත්වීම යනාදීන් ඇයගේ ධර්මය අනු මත කළ බව සිතා නොයෙක් කාර්යවල යෙදීමටද හැකිවෙ. මෙයින් ඇයද ඇගේ පවුලද පිරිහීමට ලක්වෙ. දරුවන් අකී කරු මාර්ගයෙහි හැදෙති.

මුරණ්ඩුවන බිරිඳ, තම දරුවන් බලහත්කාරයෙන් ක්‍රිස්ති යානී පල්ලිවලට කැඳවාගෙන ගොස් ඔවුන්ගේ ඇඳහීමයන් පෙන්වාදීමේ සිරිතයෙහි මුරණ්ඩුව සිටියේනම්, පවුලේ තුල බලපාන හානිය අධිකවේ. කවරෙක් කුමණ දෙයෙහි වර්ධ නය වන්නේද, ඔහු එසේම වර්ධනය වේවි.

## 2-සමාජයෙහි බලපාන හානිය

මුස්ලිම් සමාජයතුල වෙදක්කාරීන් අධික වීම අනතුරු දායක කරුණෙකි. මෙමගින් මුස්ලිම් සමාජය පිරිහීමට පත් වීම සමාජයතුල සිදුවන හානියකි. එය දැනටමත් සිදුවෙමින් පවතී. තවද, මෙමගින් ක්‍රිස්තියානීන්ගේ සමාජය වර්ධනය වන්නේය.

මෙම අවස්ථවෙහි ඔවුහු මුස්ලිම් සමාජය තුල ප්‍රවිෂ්ටවී විනාශකාර චින්තන විප්ලවයෙහිද, පවුල් පාලනය විහිදීමෙ හිද ක්‍රිස්තියානී හැසිරීමෙහිද, අඩ ඇඳුම්වලින් ස්ත්‍රී පුරුෂ එකට (සමානව) ආශ්‍රයකරන සිරිතයෙහිද, ඉස්ලාමීය ඥාන යට සහ සදාචාරයට පටහැනි ක්‍රියාවන්හි දූතයන් ලෙසද පත්වෙති.

සර්ව බලධාරී අල්ලාහ් අප සැම රැකගනු මැනවි.

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم،

# محتويات الكتاب - أحكام فقهية

# පටුන

| විෂය | පිටුව |
|---|---|
| **✱-සාකාත්හි නීතිරීති** | 3 |
| සකාතය අනිවාර්යවන කරුණු | 4 |
| සකාතයේ සුදුසුකම්ලාභීන් | 12 |
| **✱-ආහාර පිළිබඳ නීතිරීති** | 16 |
| කැපීමේ නීතිරීති | 19 |
| කැපීමේ කොන්දේසි | 20 |
| කැපීමේ පිළිවෙල් | 21 |
| දඩයම් කිරීම | 22 |
| **✱-විවාහ නීතිරීති** | 24 |
| විවාහයේ කොන්දේසි | 24 |
| විවාහයේ පල ප්‍රයෝජන | 27 |
| සුන්නත් හා පිළිවෙල් | 28 |
| මනාලියගේ ගුණාංග | 29 |
| තහනම් ස්ත්‍රීන් | 30 |
| දික්කසාදය | 34 |
| දික්කසාදය පිළිබඳ කාර්යයන් | 35 |
| ක්හුල්උ | 37 |
| විවාහයේ හා වෙන්වීමේ අයිතිය | 37 |
| මුස්ලිම් නොවන්නන් විවාහ කිරීම | 39 |
| වේදකාරීන් විවාහ කිරීමේ පලවිපාක | 41 |

مطبعة النرجس التجارية
NARJIS PRINTING PRESS
تلفون : ٢٣١٦٦٥٣ ، ٢٣١٦٦٥٤
فاكس : ٢٣١٦٨٦٦ الرياض

السنهالية
٢٢٢

# أحكام فقهية



ردمك ٦-٢٨-٨٦٤-٩٩٦٠

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي سلطانة بالرياض
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف ٤٢٤٠٠٧٧ فاكس ٤٢٥١٠٠٥ ص ب ٩٢٦٧٥ الرياض ١١٦٦٣ شارع السويدي - السعودية
بريد إلكتروني: E-mail : Sultanah@hotmail.com